// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,956 - 2016 පෙබරවාරි මස 26 වැනි සිකුරාදා - 2016.02.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 630 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 630 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මාර්තු මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මාර්තු මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

**සමුපකාර සේවක කොමිෂන් සභාව - වයඹ පළාත**

විනය පරීක්ෂණ මණ්ඩලයට තෝරාගත් නාම ලේඛනය ගැසට් කිරීම

1995 අංක 5 දරන ප්‍රඥප්තියේ 11(1) ඉ වගන්තිය සහ 1997.09.19 දිනැති *ගැසට් පත්‍රයේ* පළ වූ සංශෝධිත රෙගුලාසි මාලාවේ 9 වගන්තියේ සඳහන් 96 වගන්තිය සඳහා වූ සංශෝධනය යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ විනය පරීක්ෂණ මණ්ඩලය සඳහා 2015.08.21 දිනැති *ගැසට් පත්‍රය* මගින් අයදුම්පත් කැඳවා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයෙන් පහත නම් සඳහන් මහත්ම/මහත්මීන් තෝරා පත්කර ගෙන ඇති බව මෙයින් දන්වමි.

| *අ. අ.* | *නම* | *ලිපිනය* |
|---|---|---|
| 01 | ගීතා පතිනායකගේ සිරියාවතී මිය | ශ්‍රියාවාස, වටරක, ඉඟුරුවත්ත |
| 02 | සනත් අමරරත්න එදිරිසිංහ මයා | 167, හලුගම, පොතුහැර |
| 03 | හෙට්ටිරත්නායක මුදියන්සේලාගේ උපාලි තිලකරත්න මයා | 92, විලාකටුමුල්ල, නාත්තණ්ඩිය |
| 04 | කොඩිප්පිලි අරච්චිලාගේ ප්‍රේමදාස මහතා | මදවක්කුලම, ආඬිගම |
| 05 | සිංහවල්ලි ආරච්චිලාගේ සුනිල් ජයතිලක මහතා | 75, ජයරම්‍ය, අඹකොළවැව, අඹන්පොල |
| 06 | අඹගහගේ ධර්මවංශ මහතා | දම්පැලැස්ස, නාරම්මල |
| 07 | කුඩා හීරළු පතිරන්නැහැලාගේ ශිරාණි රසිකා පතිරණ මිය | කොස්වත්ත, තාරණ, උඩවෙල |
| 08 | බස්නායකරාලලාගේ අභයවික්‍රම බණ්ඩාර මයා | අලවතුපිටිය, පනලිය, පොල්ගහවෙල |
| 09 | අබේරත්න හේරත් මුදියන්සේලාගේ සාගරිකා කුමාරචන්ද්‍ර මිය | දේශවිලා, මහගම, තට්ටෑව, ආණමඩුව |
| 10 | දඩුගමගේ සුජිත දේශප්‍රිය වීරවංශ මයා | 54, සීගිරි උයන, නව නගරය, මාදම්පේ |
| 11 | බාලසූරිය පතිරන්නැහැලාගේ ලූෂාන් උදයනාත් බාලසූරිය මයා | කුඹුකුලාව, පොල්පිතිගම |
| 12 | හේරත් මුදියන්සේලාගේ රන්බණ්ඩා මයා | නාත්තණ්ඩිය පාර, උඩුබද්දව |
| 13 | බර්නාඩ් ලියනගේ මහතා | සමාධි, හලාවත |
| 14 | බෝපෙ ආරච්චිලාගේ බුද්ධිමතී පද්මලතා විජේතුංග මිය | ගල්වාරම, අලව්ව |
| 15 | හේමචන්ද්‍ර පතිරණලාගේ ගුණපාල අජිත් කුමාර මහතා | කුඹුක්වැව, දිගන්නෑව |

කොමිෂන් සභා නියමය පරිදි,

ප්‍රදීප් තිලකරත්න,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ).

නව පළාත් සභා සංකීර්ණය,
දෙවන මහල,
කුරුණෑගල.

දුරකථන අංක : 037-2228151/037-2233853.

02-808

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පේෂකර්ම උපදේශක/උපදේශිකා III පන්තියේ තනතුරුවලට සහ වඩු උපදේශක/උපදේශිකා III පන්තියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පේෂකර්ම උපදේශක/උපදේශිකා III පන්තියේ තනතුරුවලට සහ වඩු උපදේශක/උපදේශිකා III පන්තියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත දක්වා ඇති සුදුසුකම් ඇති උතුරු මැද පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2016.03.28 දින වේ.

02. බඳවා ගැනීම් සිදුකරන අවස්ථාවේ දී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

03. *සුදුසුකම් :-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු අතර මනා චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) අයදුපත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(iv) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයෙන් වූ අවුරුදු 03 ක කාලයක් උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

01. *අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :*

1. පේෂකර්ම උපදේශක/උපදේශිකා III පන්තියේ තනතුරු සඳහා -

* දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව සම්මාන තුනක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය විෂයයන් 06 කින් සමත්වීම ;

*සහ*

* රජයේ ලලිත කලා ආයතනයක උසස් පාඨමාලාව හෝ තුන් අවුරුදු පේෂකර්ම අවසාන සහතිකය ලබා තිබීම ;

*හෝ*

* පේෂකර්ම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන තුන් අවුරුදු හෝ දෑ අවුරුදු අවසාන සහතිකය ලබා තිබීම ;

*හෝ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයේ දී පේෂකර්මාන්ත විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හා රජයේ පිළිගත් ආයතනයක වියන්නියක් වශයෙන් අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

II. වඩු උපදේශක/උපදේශිකා III පන්තියේ තනතුරු සඳහා -

* දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව සම්මාන තුනක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය විෂයයන් 06 කින් සමත්වීම ;

*සහ*

* කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වඩු පුහුණු ආයතනයක එක් අවුරුදු වඩු කර්මාන්ත පුහුණු පාඨමාලාව හදාරා සියළු විෂයයන්ගෙන් සමත් වී අවසාන සහතිකය ලබා තිබීම ;

*සහ*

* එක් අවුරුදු වඩු කර්මාන්ත උසස් පාඨමාලාව හදාරා සියළුම විෂයයන්ගෙන් සමත් වූ බවට වූ සහතිකය ලබා තිබීම.

02. *වැටුප් ක්‍රමය :* රා.ප.ච. 6/2006 (iv) MN1 2006A අනුව,

රු. 13,120-10x145-11x170-10x240-10x320 = රු. 22,040

03. *විභාග ගාස්තු.-* සෑම අපේක්ෂකයෙක්ම විභාග ගාස්තුවක් උතුරු මැද පළාත් සභාවට ගෙවිය යුතු වේ. විභාග ගාස්තුව රු. 500 කි. එම විභාග ගාස්තුව උතුරු මැද පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ඒ සඳහා නිකුත් කරනු ලබන **එන්සී 100 කුවිතාන්සිය** අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ උතුරුමැද පළාතේ පොදු තැන්පත් ගිණුමට බැරවන ලෙසය. ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. (අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවා ලබා ගන්නා ලද එන්සී 100 කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

04. *අයදුම් කිරීමේ ක්‍රමය හා අදාළ තොරතුරු :*

*(අ)* මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන සකස් කළ යුතු අතර ශීර්ෂ අංක 01 සිට 08 තෙක් පළමු පිටුවට ද 09 සිට 12 දක්වා දෙවන පිටුවට ද ඉතිරිය 3 වන පිටුවට ද වන ලෙස සකස් කර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු වේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුළත් අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*(ආ)* නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2016.03.28 වැනි දිනට පෙර ''ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මහ ලේකම් කාර්යාලය, අනුරාධපුරය'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ''පේෂකර්ම උපදේශක/උපදේශිකා III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ තරග විභාගය'' හෝ ''වඩු උපදේශක/උපදේශිකා III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ තරග විභාගය'' යනුවෙන් අදාළ පරිදි සඳහන් කළ යුතු ය. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් දරන අයදුම්කරුවෙකු නම් ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය තමා සේවය කරනු ලබන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් එවිය යුතුය. තැපෑලේදී නැතිවන හෝ අස්ථානගත වන හෝ ප්‍රමාදවන ඉල්ලුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලැබේ.

05. *විභාගය පවත්වන මධ්‍යස්ථාන.-* අනුරාධපුර නගරය ආශ්‍රිත තෝරාගත් මධ්‍යස්ථාන වලදී විභාගය පැවැත් වේ.

06. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-* රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස් වරයෙකු, නීතිඥවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරිවරයෙකු හෝ වර්ෂයකට රුපියල් 2,40,360 කට නොඅඩු වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

*ලිඛිත විභාගය.-* උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ. විෂය නිර්දේශය පහත පරිදි වේ.

I. පේෂකර්ම උපදේශක/උපදේශිකා තනතුර සඳහා -

* පේෂකර්ම ගණිතය
* යන්ත්‍ර ඇඳීම
* පේෂකර්ම සටහන්
* පේෂකර්මාන්තය පිළිබඳ සාමාන්‍ය දැනීම

II. වඩු උපදේශක/උපදේශිකා තනතුර සඳහා -

* වඩු සටහන් ඇඳීම
* වඩු කර්මාන්ත වෘත්තීය ගණිතය
* වඩු කර්මාන්තය ආයුධ හා දැව
* ලී වැඩ තාක්ෂණය

ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් ද ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් ද හිමි වේ. සමත් වීම සඳහා ඒ ඒ අංශයට අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතු ය.

ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා ලද අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගය සහ ප්‍රායෝගික පරීක්ෂණය යන අංශ දෙකෙන් ම ලබාගන්නා ලද ලකුණුවල එකතුවෙහි ඉහළම ලකුණු ලැබූ අය සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් කර බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳ අවසන් තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.-* මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම් ලබන්නන් වසර තුනක පරිවාස කාලයකට යටත් කරනු ලබන අතර ඔවුන් උතුරු මැද පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටී.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.

**උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පේෂකර්ම උපදේශක/උපදේශිකා III පන්තියේ තනතුරු සඳහා සහ වඩු උපදේශක/උපදේශිකා III පන්තියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

1. අයදුම් කරන තනතුර :..........................................................................................
(වඩු උපදේශක/උපදේශිකා තනතුර/පේෂකර්ම උපදේශක/උපදේශිකා තනතුර වශයෙන් එක් තනතුරක් සඳහන් කරන්න.)

2. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :..........................................................................................
(සිංහල, දෙමළ වශයෙන් එක් භාෂාවක් සඳහන් කරන්න.)

3. අයදුම්කරුගේ සම්පූර්ණ නම :

(i) සිංහලෙන්/දෙමළෙන් :..........................................................................................
..........................................................................................

(ii) ඉංග්‍රීසියෙන් :..........................................................................................
..........................................................................................

4. අයදුම්කරුගේ මුලකුරු සමග නම :

(i) සිංහලෙන්/දෙමළෙන් :..........................................................................................

(ii) ඉංග්‍රීසියෙන් :..........................................................................................
..........................................................................................

5. අයදුම්කරුගේ ලිපිනය :

(i) සිංහලෙන්/දෙමළෙන් :..........................................................................................
..........................................................................................

(ii) ඉංග්‍රීසියෙන් :..........................................................................................
..........................................................................................

6. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................

7. ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................................................

(i) උපන් දිනය :..........................................................................................

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු :........................ මාස :.......................... දින :.............................

8. අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........................................................................................

(i) 2016.03.28 දිනට දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි කාල සීමාව :................................ සිට ................................... දක්වා

9. අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස. (සා.පෙළ) විභාගය :

| *පළමුවර* | | | *දෙවනවර* | | |
|---|---|---|---|---|---|
| වර්ෂය :............................... | විභාග අංකය :.................................. | | වර්ෂය :........................... | විභාග අංකය :.......................... | |
| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
| (i) | ............................................................ | .................... | (i) | ............................................................ | .................... |
| (ii) | ............................................................ | .................... | (ii) | ............................................................ | .................... |
| (iii) | ............................................................ | .................... | (iii) | ............................................................ | .................... |
| (iv) | ............................................................ | .................... | (iv) | ............................................................ | .................... |
| (v) | ............................................................ | .................... | (v) | ............................................................ | .................... |
| (vi) | ............................................................ | .................... | (vi)1 | ............................................................ | .................... |
| (vii) | ............................................................ | .................... | (vii) | ............................................................ | .................... |
| (viii) | ............................................................ | .................... | (viii) | ............................................................ | .................... |

09. නිවේදනයේ 4 ඡේදයේ (v) යටතේ ලබා ඇති සහතික පිළිබඳ විස්තර :..............................................................................................................
..............................................................................................................................................................................................

10. අයදුම්කරු උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම්, තනතුරේ නම හා සේවය කරන දෙපාර්තමේන්තුවේ නම හා ලිපිනය :..............................................................................................................................................................................
..............................................................................................................................................................................................

11. විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය පිළිබඳ විස්තර : අංකය හා දිනය :..............................................................................................................

| |
|---|
| මුදල් ගෙවූ කුවිතාන්සිය මෙහි අලවන්න |

අයදුම්කරුගේ ප්‍රකාශය *:* මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ විභාගය පිළිබඳ කොන්දේසි අනුව ම විසින් සාවද්‍ය තොරතුරු දක්වා ඇතොත් විභාගයට පෙර හා පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

.........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :........................................

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන............................................................ මහතා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය ........................ දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

...........................................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :.........................................................
සහතික කරන නිලධාරියාගේ නම :.....................................................
තනතුර හා නිල මුද්‍රාව :.........................................................................

12. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

මෙම දෙපාර්තමේන්තුවේ ................................................... දින සිට ......................................................................... තනතුරේ සේවය කරන .............................................................. මහතා/මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර පහ තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, කිසිදු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත්, සහතික කරමි.

ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරාගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් මුදා හැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

.....................................................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

දිනය :.....................................................

02-735

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට පේෂකර්මාන්ත උපදේශක/උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016**

වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ පේෂකර්මාන්ත උපදේශක/උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1.0 *පුරප්පාඩු සංඛ්‍යාව* : 16

2.0 *වැටුප් ක්‍රමය* :

2.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) හි MN 1/2006 A අනුව මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය : රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040

*සටහන* ***i***

*(අ)* මෙම වැටුප් ක්‍රමය වරින්වර කරනු ලබන සංශෝධන වලට යටත් වේ. මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය. මෙම තනතුරට බඳවා ගන්නා නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සඳහන් පරිදි III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුලත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. II ශ්‍රේණියට උසස් කර වසර 03 ක් ඇතුලත දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය. 1 ශ්‍රේණියට උසස් කර වසර 05 ක් ඇතුලත තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය.

*(ආ)* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුලත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

2.2 *වයස් සීමාව.-* අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවු 18ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ. ඔවුන් සිය අයැදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

2.3 *සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරා ගනු ලබන අයැදුම්කරුවන්/අයැදුම්කාරියන් වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.

(ii) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සහ 12 උප වගන්ති වල සඳහන් විධිවිධාන ද මෙම තනතුරට අදාල වේ.

(iii) එසේ තෝරාගනු ලබන අපේක්ෂකයින් වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය. ස්ථාන මාරුවීම් වලට යටත් විය යුතු ය.

(iv) මෙම තනතුර සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහයට ද, පළාත් මූල්‍ය රීති සංග්‍රහයට ද, වයඹ පළාත් පේෂ කර්මාන්ත උපදේශක/උපදේශිකා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ද, රජය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි වලට හා නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම නිලධාරීන් බැඳී සිටිය යුතු ය.

3.0 *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :

3.1 *අධ්‍යාපන සුදුසුකම්* :

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව හා තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් (06) සමත්ව තිබීම. ඉන් එක් විභාග අවස්ථාවක දී අවම වශයෙන් විෂයයන් තුනකට (03) සම්මාන සහිතව ගණිතය විෂයය සමඟ විෂයයන් හයක් (06) සමත්ව තිබිය යුතු ය ;

*සහ*

*(ආ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*විශේෂ සටහන.-*

වර්ෂ 02කට නොඅඩු කාලයක් මෙම දෙපාර්තමේන්තුවට අයත් පේෂකර්මාන්ත මධ්‍යස්ථානයක කාර්මිකයෙක්/කාර්මිකාවක් ලෙස සේවය කර ඇති අයදුම්කරුවන් ගණිතය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම ප්‍රමාණවත් වේ. (මෙම සටහන යටතේ අයැදුම්කරන අයැදුම්කරුවන් ඒ බව ආයතන ප්‍රධානියා මගින් සනාථ කළ යුතු වේ.)

3.2 *වෘත්තීය සුදුසුකම්.-* පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතනයකින් අදාල පුහුණුව ලබා පේෂ කර්මාන්ත අවසාන සහතිකය ලබා තිබීම.

*සැ.යු.-* ඉහත සියලු අධ්‍යාපන, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් 2016.03.24 දිනට සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතු ය.

4.0 *අපේක්ෂකයින්* ;

4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

4.2 තරග විභාගයට පෙනී සිටින අයැදුම්කරුවන් අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (ග්‍රාම නිලධාරීන් විසින් සහතික කරන ලද සහතිකය මත අදාල ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කර නිකුත් කරනු ලබන සහතිකයක් මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය.)

4.3 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

4.4 තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියළුම අධ්‍යාපන, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

5.0 *බඳවා ගැනීමේ ක්‍රමය.-* වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ලබන පරිදි වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක් විසින් සිදුකරනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයැදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු ප්‍රමුඛතාවය හා පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එයින් සුදුසුකම්ලත් අයැදුම්කරුවන් පේෂකර්ම උපදේශක/උපදේශිකා III වැනි ශ්‍රේණියට බඳවා ගැනේ.

6.0 *විභාග ක්‍රමය.-* විභාගය, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය වලින් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

*විෂයයන් :*

(i) *ලිඛිත විභාගය :*

| *විෂයයන්* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* | *විෂය නිර්දේශය* |
|---|---|---|---|---|
| පේෂ සටහන් | පැය 01 යි විනාඩි 30 යි | 100 | 40 | අත් යන්ත්‍ර රෙදි විවීමේ දී උපයෝගී කරනු ලබන සියළුම වියමන් ක්‍රම සහ මෝස්තර නිර්මාණය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. |
| යන්ත්‍ර සටහන් | පැය 01 යි විනාඩි 30 යි | 100 | 40 | අත් යන්ත්‍රයක උපාංග හා උපකරණ හඳුනා ගැනීම හා ඒවායේ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. |
| පේෂ ගණිතය | පැය 01 යි විනාඩි 30 යි | 100 | 40 | අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනයේ දී යොදා ගනු ලබන ගණිත ක්‍රමයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. |
| සාමාන්‍ය දැනුම | පැය 01 යි විනාඩි 30 යි | 100 | 40 | අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනයේ, ඉතිහාසය නව ප්‍රවණතාවය, අලෙවිකරණය හා කළමනාකරණය ඇතුළුව අත් යන්ත්‍ර රෙදි පිළි කර්මාන්තය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම. |

ඉහත එක් එක් විෂයන්ට අදාළව ප්‍රශ්න පත්‍ර හතරක් සකස් කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත්වන අයැදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

(ii) *ප්‍රායෝගික පරීක්ෂණය :*

| *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* | *විෂය නිර්දේශය* |
|---|---|---|---|---|
| ප්‍රායෝගික පරීක්ෂණය | විනාඩි 30 යි | 100 | 40 | 01. අත් යන්ත්‍ර, රෙදි පිළි විවීම, මෝස්තර නිර්මාණය, අත් යන්ත්‍රයක් විවීම සඳහා සකස් කර ගැනීම, ඒ සඳහා යොදාගත් උපකරණ පිළිබඳ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කර බැලීම.<br><br>02. දෙන ලද කාලයකදී යන්ත්‍රගත වෝපයක දෙන ලද මෝස්තරයක් විවීමට සැලැස්වීම.<br><br>වියන ලද ප්‍රමාණය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. විවීමේදී ඇතිවන දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. (පලුදු, රීඩ් මාර්ක්, පා පොලු පෑගීමේ වැරදි, ෂටල් වැටීම යනාදිය) |

7.0. විභාග ගාස්තු වශයෙන් රු. 500 ක් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 2003-02-13 දරණ ආදායම් ශීර්ෂයට බැරවන පරිදි තමුන් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද ව.ප.ස.මු/2 ලදුපත අයැදුම්පතට අමුණා එවිය යුතු ය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැලකිය යුතු ය. මෙම රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

8.0. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

8.1 මෙම නිවේදනයේ පහලින් ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 05 තෙක් පළමු පිටුවට ද, 06 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටු වලට ද ඇතුළත් වන සේ අයැදුම්පත සකස් කර ගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයැදුම්පත්‍රය 2016.03.24 දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයැදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ පේෂකර්මාන්ත උපදේශක/උපදේශිකා III ශ්‍රේණියට බඳවා ගැනීම - 2016" යනුවෙන් සඳහන් කළ යුතු ය . (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතු වේ.)

8.2 *අත්සන සහතික කිරීම.*- මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස් වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ රු. 20,040 මාසික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.

9.0 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2016.03.24 වේ.

10.0 මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම්වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබිය යුතුය. අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙකුම අදාළ සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

11.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය.*- අපේක්ෂකයන් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතු ය.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ජාතික හැඳුනුම්පත,

(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**සටහන.**- විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත්වන අපේක්ෂකයින් විභාගයට සුදුසු අයවලුන් ලෙස සළකනු නොලැබේ.

12.0 යම්කිසි අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රය විභාගයට යටත් පිරිසෙයින් දින 07 කට පෙර නොලැබුණහොත්, ඒ බව වහාම "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට දැන්විය යුතුය. එසේ දැනුම් දී පහත විස්තර ඉදිරිපත් කළ යුතු ය.

(අ) විභාගයේ නම :————.
(ආ) අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය :————.
(ඇ) අයදුම්පත යොමු කළ ලිපිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය හා දිනය :————.

13.0 යම් අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම කරනු ලැබේ.

14.0 දැනට වාර්තා වී ඇති පුරප්පාඩු හා ඉදිරියේ දී ඇතිවන පුරප්පාඩු මෙම විභාගයෙන් සමත් අයවලුන් සිටීනම් එම අයගෙන් පිරවීම සම්බන්ධයෙන් හා අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණක් හෝ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කාන්ති වේහැල්ල,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

2016 පෙබරවාරි මස,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල,
037-2233769

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට පේෂකර්මාන්ත උපදේශක/උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016**

1. 1.1 මුල'කුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................
..........................................................................................

1.2 මුල'කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................
..........................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................
..........................................................................................

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................
..........................................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

2. 2.1 ස්ථිර ලිපිනය :―――――.

2.2 දුරකථන අංකය : පෞද්ගලික :―――――. රාජකාරි :―――――.

3. ස්ත්‍රී පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

4. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

5. උපන් දිනය : වර්ෂය :―――――. මාසය :―――――. දිනය :―――――.

5.1 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2016.03.24 දිනට වයස :

අවුරුදු :―――――. මාස :―――――. දින :―――――.

6. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් : (අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3.1 යටතේ),

*(අ)* අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා විභාග අංකය :

පළමුවර : වර්ෂය :―――――.
විභාග අංකය :―――――.

දෙවනවර : වර්ෂය :―――――.
විභාග අංකය :―――――.

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* | | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* | |
|---|---|---|---|---|---|
| | *පළමුවර* | *දෙවනවර* | | *පළමුවර* | *දෙවනවර* |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

*(ආ)* (i) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය :―――――.
(ii) විභාග අංකය :―――――.

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |

*(ඇ)* වෘත්තීය සුදුසුකම් (නිවේදනයේ අංක 3.2 යටතේ හදාරා ඇති පාඨමාලා පිළිබඳව පැහැදිලිව සඳහන් කරන්න.) මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :―――――.
දිනය :―――――.
ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :―――――.

*ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න.*

08. ..........................................වන මා විසින් මෙම අයැදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සඳහන් කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් වයඹ පළාත් සභාවේ පේෂකර්මාන්ත උපදේශක/උපදේශිකා III ශ්‍රේණියේ තනතුරට පත්කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද, මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයැදුම් පත්‍රය ඉදිරිපත් කරන...................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, විභාග ගාස්තු ගෙවා ඇති බව ද, ..................... අංක දරන ලදුපත අලවා ඇති බවද, ඔහු/ඇය .......................................... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ නම :————.
අත්සන :————.
තනතුර හා නිල මුද්‍රාව :————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්වයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ රු. 20,040 ක මාසික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.)

*රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය*

(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයැදුම්කරු/අයැදුම්කාරිය වන........................................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයෙකු බවද, ඔහු/ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බවද, ඔහුගේ/ඇයගේ අයැදුම්පතේ දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමඟ හරි වැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බවද මම සහතික කරමි.

**නිවේදනයේ 3.1 යටතේ ඇති විශේෂ නිවේදනයට අනුව අයදුම්කර ඇති අයදුම්කරුවකු නම් පමණක් මෙම කොටස සම්පූර්ණ කරන්න.**

මෙම අයැදුම්කරු/අයැදුම්කාරිය වයඹ පළාත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත්.......................... පේෂකර්මාන්ත මධ්‍යස්ථානයේ කාර්මිකයෙකු/කාර්මිකාවක ලෙස ................ සිට .................. දක්වා සේවය කර ඇති/කරන බව සහතික කරමි.

..............................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

02-836

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.